12 ශ්‍රේණිය

දේශපාලන විද්‍යාව - I

පිළිතුරු පත්‍රය

| අ.අ. | පිළිතුරු | අ.අ. | පිළිතුරු |
|---|---|---|---|
| 01 | 2 | 26 | 2 |
| 02 | 3 | 27 | 1 |
| 03 | 4 | 28 | 4 |
| 04 | 4 | 29 | 5 |
| 05 | 1 | 30 | 5 |
| 06 | 2 | 31 | 3 |
| 07 | 1 | 32 | 1 |
| 08 | 3 | 33 | 3 |
| 09 | 4 | 34 | 1 |
| 10 | 1 | 35 | 4 |
| 11 | 5 | 36 | 4 |
| 12 | 5 | 37 | 5 |
| 13 | 5 | 38 | 2 |
| 14 | 2 | 39 | 3 |
| 15 | 1 | 40 | 1 |
| 16 | 5 | 41 | 4 |
| 17 | 3 | 42 | 3 |
| 18 | 2 | 43 | 5 |
| 19 | 4 | 44 | 5 |
| 20 | 4 | 45 | 2 |
| 21 | 2 | 46 | 2 |
| 22 | 3 | 47 | 4 |
| 23 | 5 | 48 | 3 |
| 24 | 1 | 49 | 1 |
| 25 | 3 | 50 | 2 |

**12 ශ්‍රේණිය**

**දේශපාලන විද්‍යාව - II**

**පිළිතුරු පත්‍රය**

**A කොටස**

01) i. ප්ලේටෝ ii. ඇරිස්ටෝටල්

02) i. සිසරෝ , පොලිබියස් , සෙනෙකා
ii. ශාන් ඃ ඔගස්තින් , ශා ඃ නෝ ඃ ඇක්වයිනාස්

03) i. දාර්ශනික ii. චර්යාවාදී

04) i. මොන්ටිවිඩියෝ ii. වෙස්ට්පෝලියා

05) i. තෝමස් හොබ්ස් ii. ජෝන් ලොක්

06) i. රාජ්‍ය ii. ආණ්ඩුව

07) i. සරල බහුතර නියෝජන ක්‍රමය ii. සමානුපාතික නියෝජන ක්‍රමය

08) i. දේශපාලන සංස්කෘතිය ii. දේශපාලන චර්යාව

09) i. සදාචාරාත්මක යුතුකම් ii. නීතිමය යුතුකම්

10) i. ලොඞ් ඩෙනිංග් ii. ඇරිස්ටෝටල්

11) i. පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම ii. ආණ්ඩුකාරවරයා

12) i. 9 ii. 6

13) i. හිංදු - ආරුමුග නාවලර් / පොන්නම්බම් අරුනාචලම් / පොන්නම්බලම් රාමනාදන්
ii. ඉස්ලාම් - M.C. සිද්දි ලෙබ්බේ / T.B. ජයා /L.M. අසීස්

14) i. ලාංකික ඇමතිවරු ii. රාජ්‍ය නිළධාරීන් තිදෙනා (බ්‍රිතාන්‍ය)

15) i. අණ්ඩුකාරවරයා ii. අග්‍රාණ්ඩුකාරවරයා

16) i. භූමිය ii. ජනගහනය

17) i. රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය ii. රාජ්‍ය සේවා විනය මණ්ඩලය

18) i. 196 ii. 29

19) i. 5 ii. $4\frac{1}{2}$

20) 1. මානසික හෝ ශාරීරික ආබාධයකින් පෙළීම.
2. චරිත දූෂණය.
3. අල්ලස් හෝ වෙනත් දූෂණ.
4. රාජ්‍ය ද්‍රෝහී වීම්.
5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා උල්ලංගනය කිරීම.

## 12 ශ්‍රේණිය

## දේශපාලන විද්‍යාව - පිළිතුරු පත්‍රය

01. 1. දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් බවත්, එය ඉතිහාසය, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, මනෝ විද්‍යාව,සමාජ විද්‍යාව වැනි විෂයන් සමඟ සමීප සම්බන්ධතාවයක් පවතින බව තහවුරු කර තිබිය යුතුය.

ii. ග්‍රීක යුගයේ සිට අද දක්වාම දේශපාලන විද්‍යාව වෙනස්කම්වලට ලක්වෙමින්, විෂය වර්ධනය වු බව පෙන්වා තිබිය යුතුය. ඒ ඒ යුගවශයෙන් හෝ විෂයට එක් වු මතෘකා ඇසුරින් හෝ වු වෙනස්කම් දැක්වීම ප්‍රමාණවත්ය. සමාජ විද්‍යා විෂයයක් ගතිකත්වයන්ට ලක්වීම සාමාන්‍ය දෙයක් බව පෙන්වා තිබීය ද වැදගත්.

iii. දේශපාලන විද්‍යාව හැදෑරීමේ වැදගත්කම හෝ ප්‍රයෝජනවත් බව තහවුරු කරන පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න.
හොඳ පුරවැසියෙකු වීම.
දේශපාලන ඥානය පුළුල්වීම.
හොඳ රාජ්‍යතාන්ත්‍රිකයෙකුවීම. ආදී,

iv. දේශපාලන විද්‍යාවේ විෂය කේෂ්තය කලින් කලට වෙනස් වු බවත්, වර්තමානයේ විෂය කේෂ්ත්‍රය ලෙස පිළිගනු ලබන්නේ පහත සඳහන් කරුණු ඇසුරින් අදාළ කරුණු සලකා බලා ලකුණු දෙන්න.

- දේශපාලන දර්ශනය,න්‍යාය,මතවාද ආදී
- දේශපාලන පක්ෂ,බලපෑම් කණ්ඩායම්
- ජාත්‍යන්තර දේශපාලනය
- රාජ්‍ය පරිපාලනය
- ගැටුම් ආදී කරුණු 11 ක් ඇත.

02. 1. ජාතික රාජ්‍ය ආරම්භවීමට බලපෑ හේතු හා ජාතික රාජ්‍ය වර්ධනයවීම, ජාතික රාජ්‍ය සතු ලක්ෂණ පෙන්වා තිබීම වැදගත් වේ.

ii. රාජ්‍ය ආර්ථික මුහුණුවර අනුව වර්ග කිරිමක් බවත්, නිර්බාධවාදී රාජ්‍ය ක්‍රමයෙන් පසුව බිහිවු බව දක්වා තිබීම. සුබ සාධක රාජ්‍ය ක්‍රමය බිහිවීම සඳහා බලපෑ හේතු සාකච්ජා කළ යුතුය. රාජ්‍ය ආර්ථික කටයුතුවලට මැදිහත්වීම ද පෙන්වා දිය යුතුය.

iii. රාජ්‍ය හඳුන්වාදීම හා සමාජය, හඳුන්වා තිබීම පිළිතුරෙහි අඩංගු විය යුතු අතර, රාජ්‍ය හා සමාජයේ වෙනස්කම් පෙන්වා ඇත්නම් හොඳ පිළිතුරකි.

iv. රාජ්‍ය හැඳින්වීම හා ආණ්ඩුක්‍රම හැඳින්වීම කළයුතු අතර එම දෙකෙහි වෙනස්කම් පෙන්වා දිය යුතුය.

03. 1. ආණ්ඩුව ආර්ථකථනය කර, එහි කාර්යභාරය විස්තර කර තිබිය යුතුය.
නීතිය හා සාමය ආරක්ෂා කිරීම
සමාජ සුබසාධන කටයුතු
පරිසර කළමණාකරණය
රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන කටයුතු
ගැටුම් නිරාකරණ කටයුතු ආදි තවත් කරුණු පිළිතුරට

ii. ආණ්ඩුවේ බලය සංවර්ධනය කිරිමේ මාර්ගවල වැදගත්කම පෙන්වා තිබිය යුතුය.
සංවර්ධනය කිරිමේ මාර්ග ලෙස,
බලතල බෙදීම.
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,(ව්‍යවස්ථානුකූලවාදය) ආදී කරුණු දක්වා තිබිය යුතුය.

iii. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක ලක්ෂණ ගණනාවක් ඇති අතර,ඒවා තර්කානුකූලව පෙන්වා තිබිය යුතුය.
මහජන පරමාධිපත්‍ය
සාධාරණ මැතිවරණ
අධිකරණයේ ස්වාධිනත්වය
නිදහස් ජනමාධ්‍ය පැවැතීම ආදී කරුණු ගණනාවක් ඇත.

iv. ෆෙඩරල්වාදය ලෙස බලය බෙදා පාලනය කරන ක්‍රමයක් ලෙස(සංධීය) සිසුන් හඳුනාගෙන තිබිය යුතුය. එහි වාසි අවාසි පෙන්වා තිබීම පිළිතුරු තුළ අඩංගු විය යුතුය.

04. 1. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණ ක්‍රියාවලියට දේශපාලන පක්ෂ සම්බන්ධවන අයුරු පෙන්වා තිබිය යුතුය. ජනතාව දේශපාලන ක්‍රිඩාවේ නියැලෙන එක් මාධ්‍යයක් ලෙස පක්ෂ හඳුන්වා දිය හැක.

- ජනමතය අධිකාරි බලය බවට පත්කිරීම.
- අනාගත නායකයින් පුහුණු කිරීම.
- දේශපාලනිකව ජනතාව දැනුවත් කිරීම.
- ආදි කරුණු දක්වා තිබිය යුතුය.

ii. ප්‍රජාතන්ත්‍රික ආණ්ඩුකරණයට අත්‍යවශ්‍ය සාධයක් ලෙස බලපෑම් කණ්ඩායම් හඳුන්වා තිබිය යුතුය.
බලපෑම් කණ්ඩායම්වල ස්වභාවය දක්වා තිබීම ප්‍රමාණවත් නොවන අතර,එය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට බලපාන අයුරු දක්වා තිබිය යුතුය.

iii. සිවිල් සමාජය අර්ථදක්වා තිබිය යුතු අතර, එය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සමාජ ප්‍රගමනයට බලපාන අයුරු විස්තර කර තිබිය යුතුය.

iv. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට ජනමාධ්‍යයේ දායකත්වය පෙන්වා තිබිය යුතුය. තොරතුරු දැනගැනීමේ අයිතිය හා ජනවාධ්‍ය අපක්ෂපාති ව හැසිරිය යුතුය යන්නත්, නිදහස් ජනමාධ්‍ය රටක සංවර්ධනයට හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරිමට ඉවහල්ව බව පෙන්වා තිබිය යුතුය.

05. 1983- කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණයේ සිට 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය දක්වා ඒ ඒ ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම් බලාපොරොත්තු වේ.

1. <u>දේශපාලන ප්‍රතිඵල</u>

- ව්‍යවස්ථාදායක සභාව ඇතිකිරීම
- විධායක සභා ඇති කිරීම.
- අධිකරණයේ පද්ධතිය හඳුන්වාදීම.
- වගකීමේ ආණ්ඩුක්‍රමයට හුරු කිරීම.
- නියෝජන ක්‍රම හඳුන්වාදීම.
- පාර්ලිමේන්තු සම්ප්‍රදායන් ඇති කිරීම.
- ආදී කරුණු ඇසුරින් සිදු වූ පෞද්ගලික වෙනස්කම් ලියා තිබිය යුතුය.

<u>ii. ආර්ථික ප්‍රතිඵල</u>

- පැවති වැඩ වසම් ක්‍රමය බිඳ වැටීම.
- වාණිජවාදී ආර්ථික රටාව
- වතු ආර්ථිකය
- රාජකාරී ක්‍රමය අහෝසි කිරිම හරහා ශ්‍රම සංචලතාව ඇතිවීම.
- ධනේෂ්වර පංතියක් බිහිවීම.
- මුදල් භාවිතය/බැංකු ක්‍රම
- ආනයන/අපනයන ආර්ථිකයක් බිහිවීම.
- ආදී කරුණු ඇතුලත් විය යුතුය.

***<u>iii. සමාජ ප්‍රතිඵල</u>***

රාජකාරීක්‍රමය අහෝසිවීමේ ප්‍රතිඵල

නව සමාජ පංති බෙදීම

ඉංග්‍රිසි අධ්‍යාපන ක්‍රමය ආරම්භවීම

නව සංස්කෘතිකාංග එක්වීම ආදිය.

**iv.** **නව නිතී හඳුන්වා දීම.**

ඒකීය අධිකරණ පද්ධතියක් ස්ථාපිතවීම.

ශ්‍රේෂ්ඨාධිකරණය රටේ ඉහළ අධිකරණය බවට පත්වීම

අධිකරණ ව්‍යුහයක් හඳුන්වාදීම.

ආදී කරුණු ඇතුලත් විය යුතුය.

06. 1 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය සඳහා බලපෑ හේතු විස්තර කර තිබිය යුතුය.

- පැවති ආණ්ඩුක්‍රමයේ දුර්වලතා
- ජනතා උද්ඝෝෂණය
- බ්‍රිතාන්‍ය පාලකයින්ගේ ප්‍රතිපත්ති
- ආදී තවත් කරුණු තිබිය යුතුය.

**ii.** සර්වජන ඡන්ද බලය ලැබීම නිසා ශ්‍රී ලංකාවේ සිදු වු ආර්ථික,දේශපාලන, පරිවර්ථනය විස්තර කර තිබිය යුතුය.
දේශපාලනය හා පක්ෂ බිහිවීම
සුබසාධනය පුළුල්වීම ආදි කරුණු

iii. ඩොනමෝර් යෝජනා ලෙස වාර්ගික නියෝජනය අහෝසි කිරිමට යෝජනා වුව ද සම්පුර්ණ අහෝසි කිරිමක් නොවිය. ප්‍රාදේශිය වුව ද නියෝජිතයන් තෝරාගන්නා ක්‍රමය හඳුන්වා දෙන ලදි. යම් ආකාරයක හොඳ ප්‍රවේශයක් ලෙස සිසුන් අවබෝධ කරගෙන තිබිය යුතුය.

iv. ඩොනමෝර් ක්‍රමය නිසා ශ්‍රී ලංකාවේ සිදු වු සමාජ, ආර්ථික ,දේශපාලන,පරිවර්ථනයන් රටේ නව සංස්කෘතියත් ඇති කිරීමට සමත් වු බව හා ඉන් සමාජයට සිදු වු යහපත් අංග විස්තර කර තිබිය යුතුය.

07. 1 යටත් විජිත පාලනයේ පැවති යම් යම් ප්‍රතිපත්ති නිසා මෙරට ආගමික, පදනමකින් ඊට එරෙහිවීමේ ක්‍රියා පිළිවෙත ආගමික පුනර්ජීවන විප්ලවයක් ලෙසින් ඉදිරියට එන ලදී.
බෞද්ධ ,හින්දු ඉස්ලාම් ආගමික නායකයින් මේ සඳහා නායකත්වය දෙනු ලැබීය. එම නායකයින් හා ඔවුන් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත් දක්වා තිබිය යුතුය.

**ii.** ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ ම දිගුවක් ලෙස ජාතික ව්‍යාපාරය ඉදිරියට යාම හඳුනා ගත හැක. එහි අරමුණු, ක්‍රියාකාරිත්වය,සාමාජිකත්වය හා සාර්ථක අසාර්ථක බව සාකච්ජා වී තිබිය යුතුය.

iii. කම්කරු ව්‍යාපාරයේ නායකත්වය, ඔවුන්ගේ අරමුණු සටන් ක්‍රියාකලාපයන් විස්තර කර තිබිය යුතුය.

iv. වාමාංශික ව්‍යාපාරයේ ආරම්භය, අරමුණු හා දේශපාලන පක්ෂ වර්ධනය දක්වා එහි ගමන් මග විස්තර කර තිබිය යුතුය. වාමාංශික ව්‍යාපාරයේ බිඳවැටීම් හා බිඳවැටීමට හේතු ද දැක්වීම වැදගත් වේ.

08. **1** 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය අනුව ව්‍යවස්ථාදායකය වූ පාර්ලිමේන්තුවේ තත්වය විමසා බැලේ. පාර්ලිමේන්තුව පූර්ණ බලැති ආයතනයක් නොවූ බව හේතු සහිතව දක්වා තිබිය යුතුය. බ්‍රිතාන්‍ය කිරීටයට යටත් වූ අර්ධ ව්‍යවස්ථාදායක බලයක් ඇති ආයතනයක් විය.

**ii.** 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය අනුව සුළු ජන රැකවරණය සඳහා විධිවිධාන රාශියක් යොදා ඇත.

- සෙනෙට් සභාව
- අධිකරණ සේවා කොමිෂන් සභාව
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව
- සීමානිර්ණය කොමිෂන් සභාව
- වැනි කරුණු ඇතුලත් විය යුතුය.

iii. 1972 ජාතික රාජ්‍ය සභාව ත්‍රිවිධ බලය එක් වූ ආයතනයක් ලෙස අධික බලයක් තිබුන ආයතනයක් විය. කිසිදු ආයතනයකට යටත් නොවූ ආයතනයක් ලෙස ස්වාධීන ආයතනයක් බව තහවුරු කර තිබිය යුතුය.

iv. ශ්‍රී ලංකාව එක් මැතිවරණ කොට්ඨාසයක් ලෙස ගෙන පවත්වයි. ජනාධිපතිවරණය

- සඳහා පුද්ගලයෙකුට ඇති සුදුසුකම්,
- නාමයෝජනා දීම.
- ඡන්දය භාවිතා කළයුතු ආකාරය
- ලබාගත යුතු ඡන්ද ප්‍රමාණය
- ජයග්‍රහකයා තේරීම කළයුතු අයුරු දැක්විය යුතුය. තවද, නිල කාලය ඉකුත්වීමට පිළිවෙත ද දැක්විය යුතුය.